# නැගෙනහිර පළාත් සභා පළාත් සංවර්ධන සංසදය

ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කය රැස්වීම් වාර්ථා සටහන

**ස්ථානය :** සම්මන්ත්‍රණ ශාලාව, වරෝදය නගර්
**දිනය** : 16.05.2013

**සහභාගිවූවන්ගේ නම් හා විස්තර:**

- *යා කර ඇත*

## 1. පිළිගැනීම හා හඳුන්වා දීම

පළාත් සංවර්ධන සංසදයේ ත්‍රිකුණාමලය රැස්වීම් සඳහා පැමිණ සිටි ගරු ප්‍රධාන අමාත්‍යතුමා, අමාත්‍යවරුන්, පළාත් පාලන ආයතන වල සභාපතිවරුන්, ලේකම්වරුන් හා නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරුන් හා සෙසු නිලධාරින් ප්‍රධාන ලෙක්ම් විසින් පිළිගනු ලැබුහ. ඉන් අනතුරුව රැස්වීමට අදාළ හේතු හා අරමුණු පිළිබඳවත් පැහැදිලි කිරීම් කරන ලදි. නැගෙනහිර පළාත් සභාව මඟින් ක්‍රියාත්මක කරනු ලබන වැඩසටහන් හා ව්‍යාපෘතින් ජනතාවගේ අභිලාෂයන් හා අවශ්‍යතාවයන් සමඟ තද බැඳීමක් ඇතුව ක්‍රියාත්මක කිරීමටත් හා පළාත් මාර්ගෝපදේශක ශක්තිමත් කිරීමටත් මෙම සංසදය මඟ පාදනු ලබන බව පෙන්වා දුනි.

සංවර්ධන ක්‍රම සම්පාදන පිළිවෙතෙහි විවිධ පාර්ශවකරුවන් සහභාගිවීමට අවස්ථාවන් සලස්වාදෙන මෙම සංසදය මඟින් අවශ්‍ය සංවර්ධන පිළිබඳ තොරතුරු හා මහජන අභිලාෂයන් අවබෝධ කරගෙන සමාජයට ප්‍රතිලාභ උරුම කරන හා යහපත් ප්‍රතිඵල ගෙනත් දෙන ක්‍රියාත්මක සැලසුම් ලෙස පරිවර්තනය වීමට සහය දක්වනු නියතය.

## 2. ගරු ප්‍රධාන අමාත්‍යතුමාගේ ප්‍රකාශය

ගරු ප්‍රධාන අමාත්‍යතුමාගේ ප්‍රකාශයේදී, පළාත් සභා මන්ත්‍රීවරුන් පළාත් පලාන සභාපතිවරුන් හා සෙසු පළාත් සභා උසස් නිලධාරින් සහභාගි වන මෙම සංවර්ධන සංසද රැස්වීම් සුපුරුදු අන්දමින් පවත්නා වූ ප්‍රගති සමාලෝචන රැස්වීමක් සේ නොවන වූ ප්‍රතිපත්ති උපාය මාර්ගයන් කරා ලංකරවන සංවර්ධන කටයුතු මෙහෙයවීම් හා ප්‍රායෝගික ගැටළුවටල අදාළ නිරාකරනයන් වැනි දේ කේන්ද්‍රගත කරගත් සම්මන්ත්‍රණයක් බවට පත්වීම ඉතාමත් වැදගත් වන බවත් පවසා තමාගේ සතුට ප්‍රකාශ කර සිටියේය. මෙම සංසදයේ වැදගත්කම ගැන කරුණු දැක්වූ ප්‍රධාන අමාත්‍ය, මෙවැනි ක්‍රියා කටයුතු මඟින් මහජනතාවගේ ජීවන තත්වය නඟා සිටුවීමටත්, සංවර්ධන ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් මතුවන ගැටළුවලට තිරණ ලබා ගැනීමටත් හා වැදගත් තිරණ ගැනීමටත් බෙහෙවින් මඟ පාදන බව පැවසූ ඔහු මඩකලපුව හා අම්පාර දිස්ත්‍රික්කවලත් මෙවැනි සංසදය හැකි ඉක්මනින් පවත්වනු ලබන බවත් පෙන්වා දුන්නේය.

2012 වර්ෂයේ ලද සීමිත මූල්‍ය ප්‍රතිපාදනය සෙසු පළාත් සමඟ සැසඳෙන විට නැගෙනහිර පළාත් අමාත්‍යංශය හා දෙපාර්තමේන්තු එය ඉතාමත් සාර්ථක අන්දමින් ක්‍රියාත්මක කර තිබීම ගැන විශේෂයෙන් අදහස් දැක්වූ එතුමා ප්‍රධාන ලේකම් ඇතුළු සියළු ලේකම්වරුන්, දෙපාර්තමේන්තු ප්‍රධානීන් හා සෙසු නිලධාරීන්ටත් ප්‍රශංසා කළ අතර පවත්නා වර්ෂයේදිද කැපවීමකින් හා ශ්‍රේෂ්ඨ නායකත්වය ලබා දෙමින් ක්‍රියාත්මක වේ යැයි තමා අපේක්ෂා කරන බව පැවසුවේය.

## 3. පළාත් ක්‍රම සම්පාදන ක්‍රියාකාරකම් හා සංවර්ධන ව්‍යාපෘතින්

ජාතික සංවර්ධනය සමඟ බැඳියන අයුරින් නැගෙනහිර පළාත් සභාවට අදාල 5 වසරක ඒකාබද්ධ සංවර්ධන සැලැස්ම හා නැගෙනහිර පළාත් ආයතනික ප්‍රතිඵල රාමු සැකිල්ල හා එහි තිරණය කරනු ලැබුවාවූ වාර්ෂික ඉලක්කයන් යන කරුණු පදනම් කර ගනිමින් කේෂත්‍රයන් සමඟ බැඳුණු ආයතනික වාර්ෂික ක්‍රියාත්මක සැලසුම් සම්පාදන ක්‍රමවේදයන් ගැන පළාත් ක්‍රමසම්පාදන නියෝජ්‍ය ප්‍රධාන ලේකම් කෙටියෙන් විස්තර කර පළාත් සංවර්ධනය වෙනුවෙන් මුදල් කොමිෂන් සභාව මඟින් වෙන් කරනු ලබන මුදල් දිස්ත්‍රික් මට්ටමින් හැකිතාක් දුරට සමබරව බෙදා හරිනු ලබන බව පෙන්වා දුන් ඔහු මූල්‍ය අවශ්‍යතා පිළිබඳවත්, එහි දක්නට ලැබෙන හිඟයන් ගැනත් උපරිම අන්දමින් පවත්වාගෙන යනු ලබන මූල්‍ය උපයෝගිතා පිළිබඳවත් කරුණු දැක්විය.

විවිධ මූල්‍යය ප්‍රභවයන් හරහා සිදුවන සියලු සංවර්ධන ක්‍රියාදාමයන් ඒකාබද්ධ කර රැස්කළ වාර්ෂික ක්‍රියාත්මක සැලැස්මක් සම්පාදනය කර තිබීම හා සියළු සංවර්ධන කොටස්කරුවන්ටත් ප්‍රතිලාභ ලැබෙන අයුරින් හා වෙබ්

අඩවිය මඟින් ක්‍රියාකරවන පරිදි එය දත්ත ජාලය ඔස්සේ ක්‍රියාත්මකවීමට  නියමිතව තිබෙන බවත් විස්තර කළේය.

ගරු සෞඛ්‍ය අමාත්‍යතුමා විසින් නැගෙනහිර පළාතේ උසස් අන්දමින් ක්‍රියාත්මක වෙමින් පවතින ක්‍රම සම්පාදන ක්‍රියාකාරකම් ගැනත් එහි වැදගත් කම ගැනත් විස්තර කරනු ලැබූ අතර එය මූල්‍ය හිඟය හේතු කරගෙන සමහර අවස්ථාවන් වල බල රහිත වන බවත් 2013 වර්ෂය සඳහා නැගෙනහිර පළාතට වෙන් කරන ලද මුදල සම්පූර්ණයෙන් ලබා ගැනීමට ඇති අවශ්‍යතාව පිළිබඳවත් අවධාරණය කරනු ලැබීය.

පළාතට අදාල උවමනාවන් වලට වඩා ඉතාමත් සුළු ප්‍රමාණ මුදල් ලබා දෙනු ලබන බව පැවසූ ගරු අධ්‍යාපන අමාත්‍යතුමා ඊට අදාල පියවර සුදුසු තලයට ගෙන ගොස් මූල්‍ය අවශ්‍යතා වැඩියෙන් ලබා ගැනීමට සුදුසු කටයුතු කළ යුතු බව ඉල්ලා සිටියේය.

ගරු විරුද්ධ පක්ෂ නායකයාද ඊට සහය දක්වන අයුරින් තම අදහස් ප්‍රකාශ කර සිටි අතර සුදුසු පියවර ගැනීම පිණිස ප්‍රධාන ආමත්‍යතුමා අතිගරු ජනාධිපතිතුමා සමඟ සාකච්ඡා කරමින් ප්‍රමාණවත් මූල්‍ය ප්‍රතිපාදන ලබා ගැනීමට කටයුතු කළ යුතු යැයි ඉල්ලා සිටියේය.

ඉහත අදහස් වලට පිළිතුරු දෙමින් තම අදහස් දැක්වූ ප්‍රධාන අමාත්‍යතුමා මූල්‍ය ප්‍රතිපාදන වැඩි කර ගැනීමටත් සම්පූර්ණයෙන් එම මුදල් ලබා ගැනීමටත් අවශ්‍ය පියවර දැනටම ආරම්භ කර තිබෙන බව දන්වා සිටියේය.

## 4. ක්ෂේත්‍ර සංවර්ධන පිළබඳ සාකච්ඡාව

නැගෙනහිර පළාත් අමාත්‍යංශ විෂය කාර්යභාරයන් අනුව වැදගත් සංවර්ධන ක්ෂේත්‍රයන් සැලකිල්ලට ගනිමින් පහත දැක්වෙන මාතෘකාවන් යටතේ සාකච්ඡාවන් සිදු කරනු ලැබිනි.

- දේශිය සේවාවන් සැපයීම් හා ග්‍රාමීය සංවර්ධන
- අධ්‍යාපන සංවර්ධන හා ප්‍රවාහන පහසුකම්
- යටිතල පහසුකම් සංවර්ධන
- කෘෂිකර්ම හා සමාජීය රැකවරණ ප්‍රගතිය

එක් එක් මාතෘකාවන් යටතේ සිදු වූ සාකච්ඡාවල ආරම්භයේදී අදාල පළාත් අමාත්‍යංශයේ ලේකම්වරුන් විසින් ප්‍රධාන සංවර්ධන ඒකකයන් ආයෝජන වල සාරාංශය, වත්මන් හා අනාගත සංවර්ධන විෂයයන් පිළිබඳව (Presentation) ඉදිරිපත් කිරීම මඟින් සාකච්ඡාවට වැඩි දුරටත් පහසුකම් සැලැස්වූහ.

ඉන් අනතුරුව එක් එක් සංවර්ධන මාතෘකාවන් යටතේ පවත්වනු ලැබූ සාකච්ඡා වලදී විවිධ අදහස් සහභාගිවූවන් විසින් ඉදිරිපත් කරනු ලැබුණි.

### 4.1 දේශිය සේවා සැපයුම් හා ග්‍රාම සංවර්ධන

ඝණ අපද්‍රව්‍ය ඉවත් කරන බොහෝ වාහන අළුත් වැඩියාවන්වලට ලක් වෙමින් පවතින අතර එම වාහන සඳහා ඌනතාවය පැවැත්වේ. එය හේතු කර ගෙන ඝණ අපද්‍රව්‍ය ඉවත් කිරීමෙහිලා බොහෝ අසීරුතාවයන් වලට මුහුණ දීමට සිදුවන බවත්, එම වාහන අළුත් වැඩියා කර ගැනීමට මූල්‍ය ප්‍රතිපාදන ලබා දෙන ලෙසත්, ඊට අමතරව පළාත් විදේශිය මූල්‍ය ආධාර මඟින් ඝණ අපද්‍රව්‍ය ඉවත් කිරීමට අවශ්‍ය අළුත් වාහන මිලදී ගෙන සැපයුම් කරන ලෙසත් කින්නියා නගර සභාවේ සභාපතිතුමා ඉල්ලා සිටියේය.

ප්‍රාදේශිය සභාවන් සඳහා ලබා දෙන මුදල් එහි අවශ්‍යතායන් සපුරා ලීමට ප්‍රමාණවත් නොවන බවත්, එය වැඩිකර ලබා දෙන ලෙසත් බොහෝ පළාත් පාලන ආයතන වල සභාපතිවරුන් විසින් ඉල්ලීම් ඉදිරිපත් කරනු ලැබුණි. පළාත් සංවර්ධන සංසදයට තමන්ව සහභාගිකරවීමට අවස්ථාවන් සලස්වාදීම ගැන කුච්චවෙලි ප්‍රාදේශිය සභාවේ සභාපතිවරයා තම කෘතඥතාවය පළ කර සිටියේය.

මෙම සංවර්ධන සංසදයේ ගනු ලබන තීරණ යම් නිශ්චිත කාලවකවානුව තුළ ක්‍රියාත්මක කරවීමට ගරු ප්‍රධාන අමාත්‍යතුමාගේ සභාපතිත්වයෙන් යුක්ත ගරු අමාත්‍යවරුන් හා පළාත් සභා මන්ත්‍රිවරුන් ඉදිරිපත් විය යුතු බවද ඉල්ලා සිටියේය.

ඊට පිළිතුරු දුන් ගරු ප්‍රධාන අමාත්‍යතුමා මහජනතාවගේ ගැටළු නිරාකරණය කර දිමට පහසුකම් සපයා දිම මෙම සංසදයේ එක අරමුණක් වන බවත් සඳහන් කළ එතුමා පළාත් ප්‍රධාන අමාත්‍යවරුන් සමඟ වූ සාකච්ඡා වලදි අතිගරු ජනාධිපතිතුමා විසින් මහජන ගැටළුවන් ගැන විමසා දැන ගන්නා බවත් හැකිතාක් අන්දමින් අවශ්‍ය පියවර ගැනිමට කටයුතු කර ගෙන යන බවත් එම කර්තව්‍යයට සියලු රාජ්‍ය නිළධාරින්ගේ සහය ලැබෙනු ඇතැයි එතුමා පැවසිය. තව දුරටත් කරුණු දැක්වූ එතුමා පසුගිය කාලපරිච්ජේද නොව දැනට විදෙස් ආධාර වලින් සමන්විත බොහෝ සංවර්ධන ව්‍යාපෘතින් සෘජුවම පළාත් පාලන ආයතන මඟින් ක්‍රියාත්මක කිරිමට අවස්ථාවන් උදාකර දි තිබෙන බවත් පැවසිය. අමතර මූල්‍ය සම්පත් සොයා ගැනිමට හැකි සියලු වැයම් තමා විසින් ගෙන ඇති බවත් පැවසූ ගරු ප්‍රධාන අමාත්‍යතුමා ලැබෙන්නා වූ සියලු මූල්‍ය සම්පත් පළාත් පාලන ආයතනයන් මඟින් සුවිශේෂී අන්දමින් හා මහජනතාවට ප්‍රතිලාභ ගෙන දෙන ආකාරයෙන් යෙදවිය යුතු යැයි ඉල්ලා සිටියේය.

ගරු පළාත් සභා මන්ත්‍රිවරුන් අදහස් දැක්විමේදි තමන් විසින් ඉදිරිපත් කරනු ලබන කුඩා පරිමාණ ව්‍යාපෘතින් සියල්ල සාර්ථක ලෙස ක්‍රියාත්මක කර සම්පූර්ණ කිරිමට හැකිවන අයුරින් තමන් වෙත වෙන් කර දෙනු ලබන රු.මිලියන 2.0ක මුදල් සම්පූර්ණයෙන් නිදහස් කරදිමට කටයුතු කර දිය යුතු බවත් ඔවුන් විසින් ඉල්ලා සිටින ලදි.

ඊට පිළිතුරු සැපයූ ක්‍රමසම්පාදන නියෝජ්‍ය ප්‍රධාන ලේකම් සිමිත අන්දමින් ලබා දෙනු ලබන මුදලින් ගරු පළාත් සභා මන්ත්‍රිවරුන්ගේ වැඩසටහන් සඳහා ප්‍රමුඛතා පදනමින් 90%ට වැඩි මුදල් නිදහස් කරනු ලබන බවත්, ඉදිරි අනාගතයේදි එම මුදල් මුළුමනින් ලබා දිමට කටයුතු සලස්වන බවත් පැවසිය.

මෙහිදි තම අදහස් ප්‍රකාශ කිරිමට යෙදුනු ගරු විපක්ෂ නායකතුමා නැවත පදිංචි කිරිම් හා පුනරුත්ථාපන වැඩ කටයුතු සඳහා 2013 වර්ෂයේ වෙන් කර දෙනු ලැබූ මුදල් ඉතා අඩු බවත් එය වැඩි කර දිය යුතු බවත් ඉල්ලා සිටි අතර එවැනි වැඩසටහන් වලදි මුතූර් නැගෙනහිර ප්‍රදේශයෙන් අවතැන් වූ ජනතාවට ප්‍රමුඛත්වය ලබා දිය යුතු බවත් ඉල්ලා සිටියේය.

නැවත පදිංචිකරනු ලැබූවන් සඳහා වන ආධාර හා ඔවුන්ගේ පුනරුත්ථාපනය පිළිබඳව අතිගරු ජනාධිපතිතුමාගේ අවධානයට යොමු කර ඇති බවත් නැගෙනහිර පළාත් සභාවට මේ සඳහා අමතර මූල්‍ය ආධාර ලබා දෙනු ලබන බවත් ගරු ප්‍රධාන අමාත්‍යතුමා විසින් දන්වා සිටින ලදි.

පළාත් පාලන ආයතන කටයුතු හා එහි අවශ්‍යතාවයන් පිළිබඳව විවිධ කරුණු සාකච්ඡාවට ගැනිමට තිබෙන හෙයින් පළාත් පාලන සභාපති වරුන් හා ලේකම්වරුන් සමඟ විශේෂ රැස්විමක් හැකි ඉක්මනින් තම අමාත්‍ය කාර්යාලය මඟින් කටයුතු සූදානම් කරනු ලබන බව ප්‍රධාන අමාත්‍යතුමා පැවසූහ.

### 4.2 අධ්‍යාපන සංවර්ධන හා ප්‍රවාහන සේවාවන්

සේරුවිල ප්‍රාදේශිය සභා සභාපතිතුමා හා කින්නියා නගර සභාවේ සභාපතිතුමා විසින් තම ප්‍රදේශයේ පාසල් ගොඩනැගිලි පහසුකම් සඳහා පවතින ඌණතාවය ගැනත් නොනිමවා පවතින ගොඩනැගිලි ගැනත් තම කණගාටුව පළ කර සිටින ලදි. එමෙන්ම කින්නියා ප්‍රදේශයේ පවතින ගුරු හිඟය පිළබඳව කින්නියා ප්‍රාදේශිය සභා සභාපතිතුමා විසින් සංසද අවධානයට යොමු කරනු ලැබුවේය.

නව ගුරු පත්විම් සඳහා ගුරුවරුන් තෝරා ගැනිමේ කටයුතු දැනට සිදුවෙමින් පවතින බැවින් මෙම ගැටළු නොබෝ දිනකින් නිරාකරණය කරනු ලබන බවත් පාසල් ගොඩනැගිලි හා නොනිමවා පවතින ගොඩනැගිලි පිළිබඳව අවශ්‍ය පියවර දැනටමත් ගෙන ඇති බවත් පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂකවරයා පිළිතුරු දුන්නේය.

ගරු අධ්‍යාපන අමාත්‍යතුමා අදහස් දැක්විමේදි හදුනාගත් ගැටළු හා අවශ්‍යතා පිළිබඳව ගරු පළාත් සභා මන්ත්‍රිවරුන් හා පළාත් පාලන ආයතන සභාපතිවරුන් කුමන වේලාවකදි හෝ නොපැකිලිව තමා සමඟ සෘජුව සම්බන්ධ විය හැකි බවත්, එවැනි අවස්ථාවන්වල ක්ෂණිකව කටයුතු පියවර ගැනිමට වන බවත් කියා සිටියේය.

### 4.3 යටිතල පහසුකම් සංවර්ධන

ග්‍රාමීය පාර දියුණු කිරිමේ වැඩ සටහන යටතේ ක්‍රියාත්මක කරනු ලබන තඹලගමුව මාර්ග වැඩකටයුතු අවසන් වි නොමැති බව තඹගලමුව ප්‍රාදේශිය සභාවේ සභාපතිවරයා විසින් පෙන්වා දෙන ලදි. ඒ අවස්ථාවේ එම වැඩකටයුතු සියල්ල මැයි මාසය අවසානයේදි අවසන් කරනු ලබන බව මාර්ග සංවර්ධන අමාත්‍යංශ ලේකම්වරයා අදහස් දැක්විය.

ඇලස් වත්ත ප්‍රදේශ වල මාර්ග සියල්ල ඉතාමත් අබලන් තත්වයකට පත්වී ඇති බවත් මේ නිසා සංචාරකයින් හා ගම් වාසීන් බොහෝ අපහසුතාවයන්ට මුණදීමට සිදුවන බවත් නගර හා කඩවත් ප්‍රාදේශීය සභාවේ සභාපතිතුමා විසින් අදහස් දක්වන ලදී. මෙම මාර්ග පද්ධතින් කඩිනමින් අළුත් වැඩියා කර දෙන ලෙස ඔහු ඉල්ලා සිටියේය. තවත් මාර්ග ගණනාවක් මෙසේ අළුත්වැඩියා කිරීමට තිබෙන බවත් එතුමා විසින් පෙන්වා දෙන ලදි. එය පිළිගත් ගරු ප්‍රධාන අමාත්‍යතුමා සංචාරක පුරවරයන් තුළ තිබෙන පාරවල්වල අළුත් වැඩියා කටයුතු ඉතා වැදගත් වන බැවින් එහි පුනරුත්ථාපපන වැඩ කටයුතුද මෙන් නිලාවෙලි සංචාරක නිවාසයට යන මාර්ගද ඉක්මනින් පුනරුත්ථාපන කර දිය යුතු බව එතුමා ඉල්ලා සිටියේය.

කින්නියා නගර සභා සභාපතිතුමා කරුණු දැක්වීමේදී ග්‍රාමීය මාර්ග දියුණු කිරීමේ ව්‍යාපෘතිය යටතේ තම ප්‍රදේශයේ 2012 වර්ෂයේ ඉදිකරන ලද මාර්ග ගණනාවක් අඩු ප්‍රමිතියක් හේතුකරගෙන කැඩී ගොස් ඇති බවත් එම මාර්ග කඩිනමින් අලුත්වැඩියා කරදෙන ලෙසත් ඉල්ලා සිටියේය.

ගෝමරන්කඩවල - මොරවැව මාර්ගය අලුත්වැඩියා කළයුතු බව ගෝමරන්කඩවල ප්‍රාදේශීය සභා සභාපති තුමා ප්‍රකාශ කර සිටියදී එම මාර්ග අලුත්වැඩියා කරන්නේනම් අවම වශයෙන් දින 03 කට ප්‍රධාන පාර වසා දැම්මට සිදුවේ යැයි පළාත් මාර්ග අධ්‍යක්‍ෂවරයා විසින් දන්වා සිටින ලදි. දෙහිවත්ත පාර නොබෝ දිනකින් ආරම්භ කිරීමට නියමිතව ඇති බවත් ත්‍රිකුණාමලය සුමේධගම පාර හා කිලෝමීටර් 08 කින් සමන්විත මොරවැව මාර්ගයේ අලුත්වැඩියා කටයුතු කඩිනම් කරනු ලබන බවත් දන්වා සිටින ලදි.

සාම්පූර් ප්‍රධාන පාර ප්‍රවාහනය සඳහා විවෘත කළයුතුයි. එසේ නොමැතිනම් ඊට විකල්පයක් ලෙස තැනු මාර්ගය අලුත්වැඩියා කළයුතුයැයි පළාත් සභා මන්ත්‍රීතුමා ඉල්ලා සිටියේය. කෙසේ හෝ සාම්පූර් ප්‍රධාන පාර විවෘත කිරීමට අවශ්‍ය කටයුතු ඉක්මනින් ගතයුතු බවට තිරණය ගන්නා ලදි.

තාහා නගර් පාර පසුගිය වසර 3 ක කාලයේ සිට අබලන් තත්ත්වයට පත්වී තිබෙන අතර තවද පෙරිය පාලම් පල්ලිය පාර, තැපැල් කන්තෝරු පාර, මුතූර් පොළපාර යනාදිය ඉතාම අබලන් තත්ත්වයට පත්වී තිබෙන බවත් එම මාර්ගයන් ඉක්මනින් අලුත්වැඩියා කිරීමට කටයුතු කළයුතුයැයි මුතූර් ප්‍රාදේශීය සභාවේ සභාපතිතුමා ඉල්ලා සිටියේය.

ඊට පිළිතුරු සැපයූ මාර්ග සංවර්ධන අමාත්‍යතුමා වෙන්කරනු ලබන මුදල් දිස්ත්‍රික්ක 3 ක් හා ජාතින් තුනක් අතර හැකිතාක් අන්දමින් සමසමව බෙදා වෙන්කර දෙනු ලබන බවත්, ඉහත ඉල්ලීම් වහාම ඉටුකිරීමට නොහැකිවුණද යථාකාලයේදී මෙම පාරවල් අලුත්වැඩියා කරදීමට පියවර ගනු ලබන බවත් ප්‍රමිතියකින් තොරව ඉදිකරනු ලැබූ මාර්ග හඳුනාගෙන සුදුසු පියවර ගැනීමට නිර්දේශ ඉදිරිපත් කිරීම සඳහා තම අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ ප්‍රධානත්වයෙන් කමිටුවක් පත්කර ඇති බවත් එම කමිටුව තමන්ගේ රාජකාරිය දැනටමත් ආරම්භ කර තිබෙන බවත් එතුමා පැවසිය.

උප්පුවෙලිහි පිහිටි කළමනාකරණ අභිවෘද්ධි මධ්‍යස්ථානය කරා යන ගොවිපොළ පාරේ වැහි කාලයේ වතුර රැඳී පවතින බවත් ඒ නිසා පුහුණුව සඳහා මධ්‍යස්ථානයට පැමිණෙන නිළධාරීන් හා ගම්වාසීන් බොහෝ අපහසුතාවයන්ට මුහුණදීමට සිදුවන බවත් එම පාර වහාම අලුත්වැඩියා කිරීමට අවශ්‍ය පියවර ගතයුතු බවත් කළමනාකරණ අභිවෘධි පුහුණු දෙපාර්තමේන්තුවේ අධ්‍යක්‍ෂවරයා ඉල්ලා සිටියේය.

එම ඉල්ලීමට පිළිතුරු සැපයූ නගර හා කඩවත් ප්‍රාදේශීය සභාවේ සභාපතිතුමා තම අදහස් ප්‍රකාශකරද්දී එම පාර ග්‍රාමීය පාර සංවර්ධන වැඩසටහන යටතේ තෝරාගෙන තිබෙන බවත් එම කටයුතු ප්‍රමාදවන්නේනම් ප්‍රාදේශීය සභාව මගින් හදිසි අලුත්වැඩියාවන් සිදුකර දෙනු ලබන බවත් පැවසිය. මෙම පාර තාවකාලික පදනම මත හෝ ප්‍රමාදයකින් තොරව අලුත්වැඩියා කරදීමට අවශ්‍ය පියවර ගන්නා ලෙස ගරු මාර්ග සංවර්ධන අමාත්‍යතුමා අදාල නිළධාරීන් වෙත උපදෙස් ලබාදුන්නේය.

නීලපොල පාර අලුත්වැඩියා කළයුතු බවට සේරුවිල ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයාද, සාම්පල්තිවු පාර අලුත්වැඩියා කළයුතු බවට ගරු විපක්‍ෂනායක තුමාද ඉල්ලීම් ඉදිරිපත් කළෝය. තවද නොනිමවී පවතින සෙල්වනායගපුරම් කදිර්ගාමත්තම්බි පාරේ වැඩකටයුතුද සම්පූර්ණකරදෙන ලෙසටත් නගර හා කඩවත් ප්‍රාදේශීය සභාවේ සභාපතිතුමා විසින් ඉල්ලීම් ඉදිරිපත් කරන ලදි.

ත්‍රිකුණාමලය විශ්වවිද්‍යාලයට යන පාර පුනරුත්ථාපනය කළයුතුයැයි ගරු පළාත් සභා මන්ත්‍රී ජනාර්තනන් මහතා විසින් ඉල්ලා සිටින ලද අවස්ථාවේ තමා ගරු පළාත් සභා මන්ත්‍රීවරයා හා ප්‍රාදේශීය සභාවේ සභාපතිතුමා සමග ගොස් එම පාරේ තත්ත්වය ගැන නිරීක්ෂණය කර අවශ්‍ය කටයුතු කරන බව ගරු අමාත්‍යතුමා පැවසිය.

කන්තලේ වාන්ඇල පාර, උමර්වීදිය, කින්නියා මාන්වෝලෙයි ඉවුර පාර, පෙරියාට්රුමුනෙයි පාර ඇතුළු කන්තලේ හා කින්නියාවේ පිහිටි සෙසු පාරවල්ද පුනරුත්ථාපනය කළයුතුයැයි ගරු පළාත් සභා මන්ත්‍රී ඉම්රාන් මහරුෆ් මහතා ඉල්ලා සිටියේය.

පළාත් සභාවේ ගරු සභාපතිතුමිය පාරවල්වල ප්‍රමිතිය හා නොනිමවා පවතින පාරවල් පිළිබඳව නිරීක්ෂණය කිරීමට යෙදෙන චාරිකාවේ තමාද එක්වීමට කැමැත්ත පළකර සිටියාය.

## 4.4 කෘෂිකර්ම හා කර්මාන්ත සංවර්ධන

කෘෂි ළිං තැනීමට ප්‍රතිලාභීන් වෙත පළාත් මූල්‍ය ව්‍යාපෘතීන් මගින් සපයනු ලබන රුපියල් 50,000/- ක මුදල ප්‍රමාණවත් නොවන බවත් ඒ සඳහා රු. 3,00,000/- ක් පමණ මුදල් වැයවන බවත් අදහස් ඉදිරිපත් කරනු ලැබිණි. මෙවන් අවස්ථාවක ඉදිකරනු ලබන ළිං වල සංඛ්‍යාව අඩුකරමින් හෝ ලබාදෙන ආධාර මුදල් වැඩිකරගතයුතු බවත් උපදෙස් ලබාදෙන ලදි. මෙම යෝජනාවට තමාගේ සහය දැක්වූ ගරු සෞඛ්‍ය අමාත්‍යතුමා සුපුරුදු ක්‍රියාපිළිවෙත්වලින් ඉවත්වී ඵලදායිතා ලගාකරදෙන ක්‍රමවේදය කරා නැඹුරුවීම කාලානෝචිත අවශ්‍යතාවක් ලෙස පත්වී තිබෙන බවත් දන්වා සිටියේය.

## 4.5 සෞඛ්‍ය හා සමාජ රැකවරණ ප්‍රගතීන්

කින්නියාවේ පිහිටුවා ඇති ආයුර්වේද බෙහෙත් ශාලාවට ප්‍රමාණවත් ලිබඩු හා උපකරණ සපයා නොමැති බවත් ඒ නිසා රෝගීන් බොහෝ අපහසුතාවයන්ට ලක්වන බවත් කින්නියා නගර සභාවේ සභාපතිතුමා පැවසිය.

මුතූර් රෝහලට වෛද්‍යවරුන් ලැගුම්ගෙන සිටීමට නිළනිවාසය අවශ්‍ය වී ඇති බවත්, එහිදී අක්‍රියව පවතින විදුලි උත්පාදන යන්ත්‍රය වහාම අලුත්වැඩියා කරදිය යුතු බවත්, මුතූර් ප්‍රාදේශීය සභාවේ සභාපතිතුමා ඉල්ලා සිටියේය. එවිට ගරු පළාත් සභා මන්ත්‍රී අන්වර් රාම්සාන් මහතා මුතූර් රෝහලේ මෘත ශරීරාගාරයේ සවිකර ඇති ශීතකරණ යන්ත්‍රය අක්‍රියව පවතින බවත් එයද අලුත්වැඩියා කර දිය යුතු බවත් ඉල්ලා සිටියේය.

ඊට පිළිතුරක් සැපයූ ගරු සෞඛ්‍ය අමාත්‍යවරයා මෙම අඩුපාඩු ඉක්මනින් විසඳා ලීමට පියවර ගනු ලබන බව පැවසුවේය.

මොරවැව රෝහලට වෛද්‍යවරුන් පත් නොකර සිටීමේ අඩුපාඩුගැන මොරවැව ප්‍රාදේශීය සභාවේ සභාපතිතුමා විසින් පෙන්වා දෙනු ලැබිණි. එසේම නාමල්වත්තේ රෝහලටද වෛද්‍යවරුන් හා සහාය වෛද්‍යවරුන් නොමැතිබවද පෙන්වා දෙන ලදි.

තඹලගමුව ප්‍රාදේශීය සභා සභාපතිවරයා, දැනට තිබෙන ක්‍රීඩාපිටිය අලුත්වැඩියා කරදෙන ලෙස ගරු සෞඛ්‍ය අමාත්‍යවරයා වෙත ඉල්ලා සිටියේය.

මෙහිදී අවධානයට යොමුකරන ලද්දාවූ සෞඛ්‍ය හා ක්‍රීඩා ක්ෂේත්‍රවල පවත්නා අඩුපාඩු, අවශ්‍යතාවයන්, සේවක සංඛ්‍යා ඌණතාවය සම්බන්ධයෙන් අමාත්‍යාංශය ශක්තිමත් වැඩපිළිවෙළ දියත්කර ගරු ආණ්ඩුකාරතුමාගේ සහය ඇතිව හැකි ඉක්මනින් විසදුම් ලබාදීමට පියවර ගනු ලබන බව ගරු සෞඛ්‍ය අමාත්‍යතුමා පිළිතුරු සැපයූහ.

සංවර්ධන සංසදයේ කටයුතු සඳහා සහභාගිවූ සියලුදෙනාට තම ප්‍රණාමය පුදකළ ප්‍රධාන ලේකම් මෙම සංසදයේදී දක්වන ලද අදහස් හා පෙන්වා දුන් අඩුපාඩුවලට අමතරව යම් කරුණු හෝ අවශ්‍යතාවයන් පිළිබඳව ඉදිරිපත්කිරීමට තිබේනම් එවැනි දේ ගැන ලිඛිතව දැනුම්දෙන ලෙස ඉල්ලා සිටින ලද අතර ඊළඟ දිස්ත්‍රික් රැස්වීම මඩකලපුව හා අම්පාර දිස්ත්‍රික්කවල ඉක්මනින් පවත්වනු ලබන බව දන්වා සිටිමත් සමඟ සංසද කටයුතු නිමාවට පත්විය.

ඩී. එම්. එස්. අබයගුණවර්ධන,

ප්‍රධාන ලේකම්,

නැගෙනහිර පළාත.